රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 15/2024

මගේ අංකය : EST-6/03/LEA/3237(1)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2024.09.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**අනුමත විදේශ නිවාඩු කාල සීමාවෙන් ඔබ්බට විධිමත් අනුමතියකින් තොරව විදේශගතව සිටින රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම**

රජයේ නිලධරයන් ආයතන සංග්‍රහයේ සලසා ඇති ප්‍රතිපාදන හෝ 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන හෝ යටතේ විදේශගත වේ. මෙලෙස විදේශගත වන ඇතැම් නිලධරයන් අනුමතිය ලබා ඇති විදේශ නිවාඩු කාල සීමාව අවසානයේ නියමිත පරිදි සේවයට වාර්තා කිරීමෙන් තොරව, අනුමත නිවාඩු කාල සීමාව ඉක්මවා නැවත දිවයිනට පැමිණ සේවයට වාර්තා කිරීමේ වැඩි ප්‍රවණතාවක් වර්තමානයේ පවතී. එම තත්ත්වයට අදාළ ආයතන ප්‍රධානීන් විසින් නියමිත පරිදි තම රාජකාරි වගකීම් ඉටු නොකිරීම ද බලපා ඇති බව මෙම අමාත්‍යාංශය වෙත වාර්තා වී ඇති කරුණු අනුව නිරීක්ෂණය කරමි.

02. විධිමත් විදේශ නිවාඩු අනුමතියකින් තොරව සේවයට වාර්තා නොකරන නිලධරයෙකු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව දැනටමත් පවත්නා පහත විධිවිධාන වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදය
ii. ආයතන සංග්‍රහයේ පළමු වන කාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ 7 වගන්තිය
iii. ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 37 වගන්තිය

03. විධිමත් අනුමතියකින් තොරව සේවයට වාර්තා නොකරන නිලධරයන් සම්බන්ධයෙන් ඉහත ප්‍රතිපාදන අනුව නොපමාව කටයුතු නොකිරීම හේතුවෙන්, අදාළ ආයතන තුළ විවිධ පරිපාලන ගැටලු උද්ගත වන අතර එය කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් මහජනයා වෙත ලබා දීම කෙරෙහි ඍජු බලපෑමක් එල්ල කරනු ලබයි. මෙවැනි අවස්ථා වැළැක්වීම සඳහා ඉහත සඳහන් කර ඇති විධිවිධාන මෙන්ම, පහතින් දක්වා ඇති තත්ත්වයන් පිළිබඳව ද අවධානය යොමු කර, ඉහත 02 ඡේදයෙහි සඳහන් විධිවිධාන පරිදි අප්‍රමාදව කටයුතු කළ යුතු ය.

I) කිසියම් නිශ්චිත කාලයකට අනුමත කරන ලද විදේශ නිවාඩුවක්, දීර්ඝ කරවා ගැනීමට ඉල්ලීමක් කරන්නේ නම්, ඒ සඳහා අනුමතිය දීමට ප්‍රමාණවත් කාලයක් තබා ඒ සඳහා ඉල්ලුම් කළ යුතු අතර දීර්ඝ කිරීම සඳහා අනුමතිය මුල් විදේශ නිවාඩු කාලය අවසන් වීමට පෙර ලබා ගත යුතු ය.
II) එවැනි විධිමත් විදේශ නිවාඩු දීර්ඝ කිරීමක් නොමැතිව අනුමත නිවාඩු කාල සීමාව අවසානයේ නියමිත දිනට සේවයට වාර්තා නොකරන නිලධරයන් සඳහා අදාළ බලධරයන්

විසින් තනතුර අතහැර යාමේ නිවේදන නිකුත් කර නොතිබුණ ද, තනතුර අතහැර ගිය නිලධරයන් ලෙස සැලකිය යුතු ය. ඔවුන් වෙත තනතුර අතහැර යාමේ නිවේදනය කඩිනමින් නිකුත් කළ යුතු අතර නැවත සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදිය යුතු ය.

III) විදේශගතව සිට නිවාඩු දීර්ඝ කර ගැනීම සඳහා ඉල්ලුම් කරනු ලබන නිලධරයෙකුහට ඊට අනුමතිය ලබා දීම සම්බන්ධයෙන් යම් ගැටලුවක් තිබේ නම් සහ එම ගැටලුව පළමු විදේශ නිවාඩු කාල සීමාව අවසන් වීමට පෙර විසඳා ගත නොහැකි බවට නිරීක්ෂණය වන්නේ නම්, අදාළ නිලධරයාට වහාම නැවත සේවයට වාර්තා කරන ලෙස දැනුම් දිය යුතු ය.

IV) නිවාඩු දීර්ඝ කිරීමක් ඉල්ලා තිබුණ ද, මුල් විදේශ නිවාඩු කාල සීමාව අවසන් වීමට පෙර නිවාඩුව දීර්ඝ කිරීම සඳහා අනුමතිය ලබා දී නොමැති නම්, අදාළ නිලධරයා වහාම සේවයට වාර්තා කළ යුතු අතර එසේ සේවයට වාර්තා නොකරන නිලධරයන් සම්බන්ධයෙන් ඉහත IIහි විධිවිධාන පරිදි කටයුතු කළ යුතු ය.

04. එමෙන් ම, විධිමත් පරිදි විදේශ නිවාඩු සඳහා අනුමතිය ලබා දී ඇති කාල සීමාවෙන් ඔබ්බට විදේශගතව සිටින නිලධරයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ විධිවිධාන පරිදි ක්‍රියා කිරීම සඳහා වන වගකීම කිසියම් බලධරයෙකු විසින් පැහැර හරින ලද අවස්ථාවන්හි දී, ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 1:2 වගන්තියේ විධිවිධාන අනුව, එම බලධරයා සම්බන්ධයෙන් ද විනයානුකූලව කටයුතු කළ යුතු ය.

05. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය මත නිකුත් කරනු ලැබේ.


ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk